# ප්‍රවෘත්ති නිවේදනයයි

## යෝජිත 18 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ප්‍රකාශය

දිවයිනේ නීති අධ්‍යයන ආයතන නියෝජනය කරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වන අප, රජය විසින් සැප්. 8 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබීමට නියමිත 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන යෝජනා පිළිබඳ දැඩි අප්‍රසාදය මෙයින් පළ කරන අතර පහත දැක්වෙන හේතූන් නිසා එම තීරණය නැවත සලකා බලන මෙන් රජයෙන් ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිමු.

- ආණ්ඩු ක්‍රම ව්‍යවසථාව යනු රටක මූලික නීතිය වන අතර රාජ්‍ය පාලන ව්‍යුහය දක්වන ලියවිල්ලයි. එබැවින් මෙබඳු බැරෑරුම් සංශෝධනයක් පොදු මහජන සංවාදයකට ඉඩක් නොතබා ම **හදිසි** කෙටුම්පතක් වශයෙන් ගෙන ඒම අනුමත කළ නොහැකි අතර නිසි විනිවිද පෙනෙන සුළු පටිපාටියක් අනුගමනය නො කරන සංශෝධනයන් ඊට අවැසි සුජාතභාවය නොලබන බව හා පොදු මහජන පිළිගැනීමකට ලක් නොවන බව සිහිපත් කරමු.

- කඩිනම් ආර්ථික සංවර්ධනයක් උදෙසා බලය සංකේන්ද්‍රගත වූ බලවත් විධායක ජනාධිපති ධූරයක් අවශ්‍ය බවට රජය පාර්ශවයෙන් නගන තර්කය  පිළිගත නොහැක්කකි. ඉන්දියාව 8% කට ආසන්න ආර්ථික සංවර්ධන වේගයක් පවත්වා ගෙන යනු ලබන්නේ පාර්ලිමේන්තුවේ පාලනයට යටත් කැබිනට් අගමැති ක්‍රමයක් යටතේය.
  තවද, රටේ යහ පාලනය,පුරවැසි අයිතිවාසිකම් හෝ නිදහස උගසට තබා ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන සංවර්ධනය සැබෑ සංවර්ධනයක්ද යන්න ද ගැටළුවකි.

- යෝජිත සංශෝධනය මඟින් 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඉදිරිපත් වූ වඩාත් ම ප්‍රගතිශීලී සංශෝධනය වූ 17 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හරය ඉන් ඉවත් කිරීම බරපතළ කරුණකි. රටේ වැදගත් තනතුරු හා ආයතන වෙත කෙරෙන පත් කිරීම් නිර්දේශපාලනීකරණය කිරීම තුළින් යහ පාලනයක් ඇති කිරීමේ එහි මුඛ්‍ය අරමුණ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම මඟින් ව්‍යර්ථ වන අතර යෝජනා කොට තිබෙන පාර්ලිමේන්තු කවුන්සිලය ජනාධිපති ධූරයේ බලතල අවභාවිතය සංවරණය කිරීමට තරම් බලයක් නො දරන බව පැහැදිලිය.

- කලින් කලට පැවැත්වෙන නිදහස් හා සාධාරණ මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණයකි.
  ස්වාධීන මැතිවරණ කොමිසමක පැවැත්මට ඇති ඉඩකඩ යෝජිත සංශෝධනය මඟින් අහුරා ලනු ලබන අතර මැතිවරණ සමයන්හි දී පෞද්ගලික මාධ්‍ය වෙත අත පෙවීම් කළ හැකි ලෙස කරනු ලබන සංශෝධනයන් නිදහස් හා සාධාරණ මැතිවරණ මතු නොව ජනතාවගේ භාෂණයේ නිදහසද අනතුරේ හෙළනු ඇත.

- ස්වාධීන පොලිස් කොමිසම අහෝසි කිරීම නීතිය ක්‍රියාත්මක කිරීමේ විනිවිද භාවය තුරන් කිරීමට හේතු වන අතර නීතියේ පාලනය අනතුරේ හෙළයි.

එබැවින්  යෝජිත සංශෝධනය හදිසි කෙටුම්පතක් වශයෙන් සම්මත නිරීමෙන් වළකින ලෙසත්, එය පොදු මහජන සංවාදයකට බඳුන් කරන ලෙසත් අප රජයෙන් ඉල්ලා සිටිමු.
තවද, මෙම හදිසි කෙටුම්පතට එරෙහිව තම හෘදය සාක්ෂියට එකඟව පාර්ලිමේන්තුවේ දී සිය ඡන්දය භාවිත කරන මෙන් සියලුම ආණ්ඩු පක්ෂ හා විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන්  කාරුණිකව ඉල්ලා සිටිමු.

මෙයට,

**නීති පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය**
කුමුදු වීරවර්ධන, ලුවී නිරංජන්, විශාකා විජේනායක, අනුෂ්කා ගුණවර්ධන,  දමිත කරුණාරත්න, මයිකල් මෙන්ඩිස්, ලිලාන් රන්දික, තිදස් මඩුවෙල්තැන්න, සමින්දිකා ඇල්කඩුව, කේ.එල්.ඩී. අසේල, බුද්ධික එදිරිසිංහ, අශාන් තිලංග

**ශ්‍රී ලංකා නීති විද්‍යාලය**
මනෝජ් ද සිල්වා,චතුරිකා රූපසිංහ

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
ළහිරු ප්‍රනාන්දු, තයාගරාජා වරදාස්